**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina**

තමන්ගේ අනන්‍යතාවය හෙළිදරවු වෙනවාට අකැමැති මූලාශ්‍රයන් සිය පුවත් වාර්තාවන් සඳහා භාවිතා කිරීමේදී, එම අනන්‍යතාවයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සදාචාරාත්මක වගකීමක් මාධ්‍යවේදියෙකු හට පවතී. කෙසේ නමුත් මෙසේ මූලාශ්‍රයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා මූලාශ්‍ර සඳහන් නොකිරීම සිදුවිය යුත්තේ එම මූලාශ්‍රයන්ගෙන් ඒ සඳහා අවසරයක් නොමැති විටකදී පමණි. ඒ හැරෙන්නට අනෙක් හැකි සෑම විටකම මාධ්‍ය ආචාර ධාර්මික භාවිතාව විය යුත්තේ, සිය පුවත් වාර්තාවන්ගේ විශ්වාසනීයත්වය වෙනුවෙන් අදාළ කරුණු සඳහා වන මූලාශ්‍රයන් සඳහන් කිරීමයි. අවශ්‍ය නම් මාධ්‍යවේදියෙකුට මූලාශ්‍ර රහිත තහවුරු නොවූ/නිරවද්‍ය නොවූ කරුණු පවා ජනගත කළ හැකි බැවින්, මෙම මූලාශ්‍ර සඳහන් කිරීමේ භාවිතාව වඩාත් වැදගත් වෙයි.

ඉරුදින දිවයින පුවත්පතෙහි පළ වූ පහත පුවත මේ සඳහා උදාහරණයක් ලෙසින් නිරීක්ෂණය කළ හැක. මෙහි පැහැදිලි මූලාශ්‍රයන් සඳහන් වී නොමැති බව දැකිය හැක. ඊට හේතුව වන්නේ එම තොරතුරු රහසිගත බව ආරක්ෂා කිරීමට සිදුව ඇති මූලාශ්‍රයන්ගෙන් ලබාගත් නිසාවෙන්ද? එසේත් නැතිනම් මෙම කරුණු තහවුරු නොවූ/නිරවද්‍ය නොවූ කරුණු නිසාවෙන්ද? පාඨක අප මනේ සම්බන්ධයෙන් නැගිය යුතු පැනය එයයි.